ZEOM
කලාප අධ්‍යාපන කාර්යාලය - මීනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

**සුවෙන් පෙරට**
**e ඉගෙනුම් පියස**
**මීනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

| වාරය - 2 | | |
|---|---|---|
| ශ්‍රේණිය : 10 | විෂයය : සිංහල සාහිත්‍ය රසාස්වාදය | පාඩම : ( 7 ) යුතුකම |

*** කතුවරයා:-**

< කොළඹ යුගයේ මුල් පරපුරේ කවියෙකි.

< ටිබෙට් ජාතික එස් ( සිකීම් ) මහින්ද හිමි.

< පරාධීන යුගයක ජාත්‍යාලය මෙන්ම ජාතිකාභිමානය ජනිත කරවාලීමට පුරෝගාමී වූවෙකි.

< ළමා කවි රචනයෙහි ද යෙදුන හිමිනමකි.

* එස් මහින්ද හිමියන්ගේ ළමා කෘති මොනවාද ?

-----------------------------------------------------

-----------------------------------------------------

-----------------------------------------------------

* උන්වහන්සේගේ ජාතිකාභිමානය දනවන කෘති මොනවාද ?

-----------------------------------------------------

-----------------------------------------------------

-----------------------------------------------------

-----------------------------------------------------

- **යුතුකම් කවියට පූර්විකාවක්**

* අදීන මිනිසෙකු ලෙස ජීවත් වීමේ දී තම සිතුම් පැතුම් හැඩගසා ගත යුතු අන්දම සිහිපත් කිරීම.

* ශ්‍රී ලාංකිකයකු වශයෙන් තම යුතුකම් හා වගකීම සිහිපත් කිරීම.

* බ්‍රිතාන්‍යයන්ට අප රට යටත් ව තිබූ යුගයක ස්වදේශවාසී ජනයා තුළ ස්වෛරීත්වය පිළිබඳ අදහස් ජනිත කරවීමේ කාලීන අවශ්‍යතා උදෙසා කවිය අවියක් කොට ගත් නිර්මාණයකි.

* සුවිශාල ආකල්පමය විප්ලවයක් සඳහා ජනතාව උසි ගැන්වීමට යොදාගත් කාව්‍ය උපක්‍රමයක් වූ ඍජු උද්වේගකර ආවේගශීලීත්වය මෙම කවි පෙළ පුරාම දක්නට ලැබේ.

* මෙම පද්‍ය පන්තියේ බස සරල ය, සුගම ය, පිරිසිදු සිංහල වදනින් සමලංකෘත ය, ජන බසෙහි වදනින් පරිපෝෂිත ය.

01.පහත දී ඇති වචනවල අරුත නිවැරදිව වටහාගෙන මෙහි සඳහන් ඉනිමග ඉදිරියෙන් ලියන්න. ඒ සඳහා වගුව තුළ සඳහන් කවි පද උපයෝගී කරගන්න.

අනුප්‍රාසය :- එකම වචනයක් හෝ එක්ම අක්ෂරයක් හෝ නැවත නැවත යෙදීම අනුප්‍රාසය නම් වේ.

උදාහරණ - නල බල සසල දළ රළ පෙළ

එළිසමය : - කවියක මුල මැද අග හෝ මුල හා අග පමණක් හෝ,නොඑසේනම් කවියේ අවසානයේ පමණක් පද්‍ය පාද හතර එකම වචනයකින් හෝ සමාන අක්ෂරයකින් අවසන් වීම වේ.

- එළිසමය → ----------------------------------------
- ද්විත්ව එළිවැට → -------------------------------------
- අනුප්‍රාසය → --------------------------------------
- ගැමි වහර → --------------------------------------
- ගැමි කටවහර → --------------------------------------
- ගාම්භීර ගැමි බස → ---------------------------------------
- ජාතික අභිමානය → -----------------------------------------
- විධි ක්‍රියා → ----------------------------------------
- ජාතික සමගිය → -----------------------------------------

* බියෙන් නොගොස් අහුමුලු වල රිංගන්ට , * ඉතින් යමව් ගම්මුන්ට ම එක් වෙන්ට, * උපන් ගමේ බල උරුමය රැක ගන්ට, * ඇතොත් ගමට ආදරයක් සිතින් සිපා, * අපේ රට අපේ ජාතිය අපේ ගම, *මුල් බැස තිබෙන ගම්මුන්ගේ සමගි සැපා ,* නිලධාරීන්ට විශ්වාසය දෙන්ට එපා , * අපේ නමට සලකත දිවි දෙමු මෙහෙම , * සටන් කෙරුම සතුටක් නම් වැසියන්ට, * ඉතින් අඬ ගසව් තම හිත මිතුරන්ට ,

02. දී ඇති කොටස් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

* උපන්නෙත් මැරෙන්නෙත් තනියමයි ලොවේ
එහෙයින් පිටත්තර වෙන විදියකින් නොවේ
එයින් එහෙම නම් තම යුතුකම් හමුවේ
බියෙන් තැති ගැනුම අප හට තරම් නොවේ

(අ) මෙම පද්‍යය පන්තිය නිර්මාණයේ දී කවියාගේ අපේක්ෂාව වී ඇත්තේ කුමක්ද?

--------------------------------------------------------------------------------------------------------

(ආ) තවම අරමුණ ඉටු කර ගැනීම සඳහා කවියා යොදා ගත් බස් වහර කෙබඳු දැයි විස්තර කරන්න

------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------

* නම්බුව කැමති අය ඇති නම් නොවී මුළා
ගම්මුන් සැවොම ගම්මුන්ට ම එකතු වෙලා
-------------------------------------------------------------------
-------------------------------------------------------------------

(අ) කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න

(ආ) නම්බුව අපේක්ෂා කරන්නන් කටයුතු කළ යුතු ආකාරය දක්වන්න

-------------------------------------------------------------------------------------

-------------------------------------------------------------------------------------

(ඇ) .ගම්මුන්ගේ ජය පතා කළ යුත්තේ කුමක්ද ?

---------------------------------------------------------------------------------------

(ඈ). නිලධාරිවාදය තත්කාලීන සමාජය තුළ මුල් බැස තිබූ බව තහවුරු වන යෙදුම් දෙකක් ලියන්න

--------------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------------

03.පහත් සඳහන් ප්‍රශ්න සඳහා උදාහරණ 3 බැගින් ලබා දෙමින් වචන 150කට නොඅඩු විචාර ලියන්න.

1. ජනතාව තුළ පවත්නා කවර දුබලතා රටේ ස්වාධීනත්වය දිනා ගැනීමට බාධාවක් වී ඇත්ද විමසන්න.

2. තම අරමුණු ඉටුකර ගැනීම සඳහා කවියා යොදාගෙන ඇති බස් වහර කෙබඳු දැයි විමසන්න.

3. මෙම පැදි පෙළට අනුව තත්කාලීන සමාජ පරිසරය තුළ පැවති සමාජ අවශ්‍යතා කුමක්ද දැයි
උදාහරණ සහිතව විමසන්න .

4. අඳින මිනිසෙකු ලෙස සමාජයේ ජීවත් වීමට තම සිතුම් පැතුම් හැඩගස්වා ගත් යුතු ආකාරය
පැදි පෙළෙන් කියැවේ නිදසුන් ඇසුරෙන් පහදන්න

05. කාලීන අවශ්‍යතාව ඉටු කරලීම උදෙසා කවියා සමාජ වගකීම තමා වෙත
පවරා ගෙන ඇති ආකාරය පැදිපෙල ඇසුරෙන් පැහැදිලි කරන්න

බප/මිනු/ දෙවලපොල ආනන්ද ම. වී
මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය,
ඩබ් . කේ ඒ යූ වරුසප්පෙරුම.